# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

සිටි යූත් පදනම,
අංක 23, තක්කියා පාර, තලාපිටිය,
ගාල්ල.

**අභියාචක**

**අභියාචනා අංකය :**
**RTIC Appeal No 91/2022**

**-එදිරිව-**

ගාල්ල මහා නගර සභාව,
මහා නගර සභා කාර්යාලය, පුරහල,
ගාල්ල.

**පොදු අධිකාරිය**

| | | |
|---|---|---|
| **ඉදිරිපිටදී** | : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) | - සභාපති |
| | 2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන | - කොමසාරිස් |
| | 3. නීතිඥ ජගත් ලියන ආරච්චි | - කොමසාරිස් |
| | 4. මොහොමඩ් නහියා | - කොමසාරිස් |

**පෙනී සිටීම** : අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වේ.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ නාගරික කොමසාරිස් ඩී.වී දිලිනි සුමාලි මිය / නම් කළ නිලධාරි සම්බන්ධ වේ.

| | | |
|---|---|---|
| **ලිඛිත සැළකිරීම්** : | අභියාචක | - ඉදිරිපත් කර නොමැත |
| | පොදු අධිකාරිය | - 2022.09.28 |

**විභාග කළ දිනය** : 2022.10.12

**තීරණය කළ දිනය** : 2022.10.12

**කොමිෂන් සභාවේ තීරණය :**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2021.09.06 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 99A තලාපිටිය ග්‍රාම නිලධාරී වසමට අයත් තක්කියා පාර සහ එහි කානු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.*

*1. මෙම මාර්ගය සහ එහි කානු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් ඔබ ආයතනය මේ වන විට ගෙන තිබෙන තීරණ වලට අදාල ලියකියවිලි වල සහතික කරන ලද පිටපත්*

*2. වසර ගණනාවක් පුරා මෙම මාර්ගය සහ එහි කානු පද්ධතිය ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු මොනවද?*

*3. මෙය ප්‍රතිසංස්කරණය කිරීමට ඔබ ආයතනය සතුව පවතින ප්‍රතිපාදන ඇතුලත් ලියකියවිලි වල සහතික කල පිටපත්*

*4. මේ වන විට මෙම මාර්ගය සහ කානු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලබාදී තිබෙන කොන්ත්‍රාත්තු ගිවිසුමේ සහතික කල පිටපත්*

*5. මෙම මාර්ගය සහ එහි කානු පද්ධතිය විධිමත්ව ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කිරීම, එම කටයුතු පිලිබදව අධීක්ෂණය කිරීම හා මාර්ගයේ කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීමට ගතවන කාලය සඳහන් කරමින් සහතික කරන ලද ලියකියවිලි"*

ඒ අනුව, තොරතුරු නිළධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.10.01 දිනැතිව නම්කළ නිළධාරී වෙත අභියාචන යොමු කර ඇත. නම්කළ නිළධාරි විසින් ද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.11.29 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අනතුරුව, තොරතුරු නිලධාරී විසින් 2021.12.13 දිනැතිව ප්‍රතිචාර දක්වමින් ප්‍රකාශ කර සිටින ලද්දේ,

*"…….. 2021.10.15 දින ඉදිරිපත් කරන ලද ලි.ප. අංක GMC /RTI /329 දරන ඉල්ලීම පරිදි එකී තොරතුරු 02 වන ඡේදයේ සඳහන් තොරතුරු හැර ඉතිරි කොටස් සැපයීමට තීරණය කරන ලද බව පනතේ 25(1) වගන්තිය අනුව මෙයින් දන්වමි.*

*මෙම ඉල්ලීම සපුරාලීම සඳහා රු. 26/= ක ගාස්තුවක් මෙම කාර්යාලය වෙත මුදලින් හෝ බැංකු අණකර මගින් ගෙවා මා වෙත දන්වන මෙන් ඉල්ලා සිටිමි…………….."*

අභියාචකගේ 2021.09.06 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2021.10.01 දිනැති අභියාචනවලට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හටද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරියා හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරියා සහ නම්කළ නිළධාරියා විසින් පැහැර හැර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

පොදු අධිකාරිය විසින් 2022.09.28 දිනැති ලිපියක්, අභියාචකට පිටපත් සහිතව, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් වෙනත් කරුණු අතර පහත සඳහන් කරුණු ප්‍රකාශ කර සිටි.

*"……….. අයදුම්පතට අදාල තොරතුරු සැපයීමට තීරණය කරන ලද බව RTI 04 ආකෘතිය ප්‍රකාරව ඉල්ලුම්කරු වෙත ලියාපදිංචි තැපැල මගින් මේ වන විටත් දැනුම් දී ඇති බව දන්වමි.*

*එකී ඉල්ලීම සඳහා වැය වන රු 26/= ක ගාස්තුව ඉල්ලුම්කරු විසින් නොගෙවීම මත අදාල තොරතුරු ඉල්ලුම්කරු වෙත ලබා දී නොමැති බව ප්‍රකාශ කර සිටිමි…………"*

**සලකා බැලීම**

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද උක්ත තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉන් පසුව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයටද පොදු අධිකාරියේ නම් කළ නිලධාරි විසින් ප්‍රතිචාර දක්වා නොමැත. මෙම තත්වය පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි.

උක්ත පනතේ 24, 25, 27 සහ 28 වන වගන්ති යටතේ තොරතුරු නිලධාරි විසින් තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් එකී විධිවිධාන පරිදි ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ. එසේම, අභියාචනය ඉදිරිපත් කළ පසු නම් කළ නිලධාරි විසින් ක්‍රියා කළ යුතු ආකාරය පනතේ 31 වන වගන්තිය යටතේ පැහැදිලිව දක්වා තිබියදීත් ඒ පිළිබඳව ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ.

මේ අන්දමින් තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් කිසිසේත් සැහැල්ලුවෙන් සැළකීමට කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ පනතේ විධිවිධාන යථා පරිදි ක්‍රියාවට නැංවීමට අසමත් වන්නේ නම් ඔවුනට එරෙහිව උක්ත සඳහන් පනතේ 38 වන වගන්තිය යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට සිදු වේ. එබැවින් මින් ඉදිරියට තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය වීම් වළක්වා ගැනීම සඳහා පොදු අධිකාරියෙහි තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තරයේ අවධාරණය කරයි.

අභියාචක විසින් 2021.11.29 වන දින මෙම කොමිෂන් සභාව වෙත අභියාචනය ඉදිරිපත් කිරීමෙන් පසු පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි විසින් 2021.12.13 වන දිනැති ලිපිය අභියාචක වෙත යවමින් තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීම සඳහා රු. 26/- ක ගාස්තුවක් ගෙවන ලෙසට ඉල්ලීමක් කර ඇත. "2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය) සඳහන් විධිවිධාන අනුව තොරතුරු මුදා හැරීම සඳහා පොදු අධිකාරියකට ගාස්තු අය කිරීමට හිමිකම ලැබී ඇත්තේ තොරතුරු නිලධාරි විසින් නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියා කරන්නේ නම් පමණි. ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමට අදාළව පොදු අධිකාරිය එකී රීතින් තුළ ක්‍රියා කර නොමැති බැවින් ගාස්තු අය කිරීම සඳහා නියමයක් කිරීමට පොදු අධිකාරියට හැකියාව නොමැති අතර තොරතුරු මුදා හැරීම ගාස්තු අය කිරීමකින් තොරව සිදු කළ යුතු වේ.

අභියාචක විසින් ඉහත තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සියලුම තොරතුරු, තොරතුරු පනතේ 5 (1) වගන්තියෙහි දැක්වෙන ව්‍යාතිරේකයන් අදාළ කර ගැනීමකින් තොරව මුදා හැරිය හැකි තොරතුරු බවට අපට නිරීක්ෂණය වේ. එබැවින් එකී තොරතුරු ඉල්ලීමෙහි දැක්වෙන සියලුම තොරතුරු 2022.10.28 දිනට ප්‍රථම, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.